ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

## <u>ඉන්දීය මහ **කොමසාරිස්** කාර්යාලය **'බුද්ධං සරණං ගච්ඡාමි'** ප්‍රදර්ශනය සමාරම්භ කරයි: නූතනත්වය හා සම්ප්‍රදාය මුසු වූ ප්‍රදර්ශනය දිවයින පුරා පැවැත්වීමට සූදානමින්</u>

කොළඹ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් 'බුද්ධං සරණං ගච්ඡාමි' යන තේමාව යටතේ ජංගම ප්‍රදර්ශනයක් මාලිගාකන්ද මහා බෝධි අග්‍ර ශ්‍රාවක විහාරයේදී සමාරම්භ කරන ලදී. නූතන ඉන්දීය කලාවේ ප්‍රවීණයන් විසින් නිර්මාණය කරන ලද බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා නිරූපණය වන සහ බුදු දහම සහ අධ්‍යාත්මය යන විෂයහි වැදගත් වන සිතුවම් රැසක් ප්‍රදර්ශනයට ඇතුළත් වේ. නූතනත්වය හා සම්ප්‍රදාය එකට මුසු වූ මමෙ ප්‍රදර්ශනය බෞද්ධ දර්ශනයේ සදාකාලික හරය කැටි කරගනිමින් එහි විශ්වීය අදාළත්වය ඉස්මතු කරයි.

2. ඉන්දියාවේ නව දිල්ලි නූතන කලාගාරය විසින් සම්පාදනය කරන ලද මමෙ ප්‍රදර්ශනය ප්‍රථම වරට 2024 වසෙක් පොහෝ දිනය නිමිත්තතේ ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කරන ලදී. මහ කොමසාරිස් කාර්යාලය මමෙ වසරේ සෑම පොහෝ දිනකදීම දිවයින පුරා විහාරස්ථානයන්හි මමෙ ප්‍රදර්ශනය සංවිධානය කරනු ඇත. මමෙ ප්‍රදර්ශනය හා සමගාමීව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් දැනට පවත්වනු ලබන ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය ද 12 වන වරටත් මහා බෝධි අග්‍ර ශ්‍රාවක විහාරයේදී පැවැත්විණ.

3. හම්බන්තොට ඉන්දීය කොන්සියුලර් ජනරාල් කාර්යාලය ද දුරුතු පොහෝ දිනය නිමිත්තතේ 'ඉන්දියාව ශ්‍රී ලාංකේය ඇසින්' යන නමින් ඡායාරූප ප්‍රදර්ශනයක් කසාගල රජ මහා විහාරයේදී සංවිධානය කර

තිබිණ. මෙම ප්‍රදර්ශනය පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී අතුල වලෙඳගොඩ මහතා සහ හම්බන්තොට ඉන්දීය කොන්සියුලර් ජනරාල් හර්වින්දර් සිං මහතා විසින් විවෘත කළ අතර එම අවස්ථාවට කසාගල රජ මහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය ඊ. ඉන්දසිරි සුමන හිමියෝ ද සහභාගී වූහ.

4. මෙම ප්‍රදර්ශන නැරඹීම සඳහා පැමිණි බැතිමතුන් රැසක් බෞද්ධ කලාව සහ සංස්කෘතිය පිළිබඳ අවබෝධය වර්ධනය කරමින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශිෂ්ටාචාරමය බැඳීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් ගත්තා මෙම මුලපිරීම් අගය කළහ.

***

***2025*** **ජනවාරි** ***13***
**කොළඹ**

වීඩියෝ යොමුව:
https://drive.google.com/drive/folders/1i9PDMuG8mv9Oo7pG1FiHc5kertcr7XQv?usp=drive_link